# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 43 දරන තායි - ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත

---

[**සහතිකය සටහන් කළේ 2007 ඔක්තෝබර් මස 12 වන දින** ]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 ඔක්තෝබර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු. 6.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

# 2007 අංක 43 දරන තායි - ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 ඔක්තෝබර් මස 12 වන දින]

එල්. ඩී. ඕ (සංස්ථාගත කිරීමේ) 3/2006

## තායි - ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

තායි - ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයට සම්බන්ධ සියළු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් හෙයියන්තුඩුවේ මාබිම පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකර ගෙන ගොස් ඇති හෙයින් ද:

එකී සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති අතර එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1**. මේ පනත 2007 අංක 43 දරන තායි - ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. මේ පනත ක්‍රියාත්මක වීම ඇරඹෙන දින සිට හා ඉන් පසු (මෙහි මින් මතුවට "මධ්‍යස්ථානය" ලෙස හඳුන්වනු ලබන) තායි - ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ වර්තමාන සාමාජිකයන් වන තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" ලෙස හඳුන්වනු ලබන) "තායි - ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය" යන අභිධානය හා නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහිත සහ එය විසින් හා එයට විරුද්ධව එකී නාමයෙන් නඩු පැවරිය හැකි, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ සහ තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරිය ඇති සංස්ථාවක් විය යුතු අතර මෙයින් එය එවැනි සංස්ථාවක් වන්නේ ය. තායි - ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම.

**3**. සංස්ථාවේ පරමාර්ථයන් විය යුත්තේ— සංස්ථාවේ පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර ආගමික සහ සංස්කෘතික සබඳතා ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම ;

2 - P L 002020 - 2,800 (2007/06)

(ආ) බුදු දහම පිළිබඳ ඇති උනන්දුව ප්‍රවර්ධනය කිරීම;

(ඇ) ථෙරවාදී බෞද්ධ ධර්මය සහ ජීවන දර්ශනය පෝෂණය කිරීම;

(ඈ) බුදු දහම අධ්‍යයනය කිරීම සඳහා පහසුකම් සැපයීම;

(ඉ) බුදු දහම ප්‍රායෝගිකව යොදා ගැනීම ධෛර්යමත් කිරීම;

(ඊ) ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් බෞද්ධයන් සහ බෞද්ධ සංවිධාන අතර එකමුතුකම සහ සහයෝගීත්වය ප්‍රවර්ධනය කිරීම;

(උ) බෞද්ධයන්ගේ සදාචාරාත්මක, සංස්කෘතිකමය, ආර්ථික සහ සමාජ ශුභසාධනය ඉහල නැංවීම;

(ඌ) අවශ්‍යතා ඇති බෞද්ධයන්ට ශුභසාධන පහසුකම් සැපයීම ;

(එ) බෞද්ධ ප්‍රජාව සඳහා අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු පහසුකම් සැපයීම;

(ඒ) සංස්ථාවේ පරමාර්ථයන්ට සමාන පරමාර්ථ ඇති වෙනත් සංගම්, සමිති සහ සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානයන්ට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා—

(අ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම;

(ආ) ඇප සුරැකුම් ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ රැස් කිරීම;

(ඇ) ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීම සහ එකතු කිරීම;

(ඈ) අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම;

(ඉ) අවශ්‍ය නිලධාරීන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීම, සේවයේ යෙදවීම සහ සේවයෙන් පහ කිරීම,

ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරෙන් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියළු ක්‍රියා කිරීමේ, කාරණා ඉටු කිරීමේ හා දේවල් ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) සංස්ථාවේ කටයුතු ප්‍රධාන අනුශාසක, සභාපති සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන හත් දෙනෙකුට නොවැඩි පස් දෙනෙකුට නොඅඩු තවත් සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත වූ විධායක කමිටුවක් විසින් මෙම පනතේ විධිවිධානයන්ට සහ රීතිවලට අනුකූලව පරිපාලනය කළ යුතු ය.

(2) අති පූජ්‍ය ප්හර ධම්මපරියත්තිවේදී මහනායක හිමියන් සංස්ථාවේ ප්‍රධාන අනුශාසකවරයා විය යුත්තේ ය.

(3) එකී අති පූජ්‍ය ප්හර ධම්මපරියත්තිවේදී මහානායක හිමි අපවත් වීමෙන් පසු හෝ ඉල්ලා අස්වීමෙන් පසු සභාපතිගේ නිර්දේශය මත සුදුසු සහ ගැලපෙන පුද්ගලයකු ප්‍රධාන අනුශාසක වශයෙන් විධායක කමිටුව විසින් පත් කළ යුතු ය.

(4) පූජ්‍ය රාස්සගල සීවලී හිමියන් සංස්ථාවේ පළමු සභාපති විය යුතු අතර එම ධුරයෙන් ඉල්ලා අස්වන තුරු හෝ ඒ ධුරය හිස්කරන තුරු ඒ ධුරය දැරිය යුත්තේ ය.

(5) මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ දී මධ්‍යස්ථානයේ විධායක කමිටුවේ සාමාජිකයන් වූ තැනැත්තන්ගෙන් සංස්ථාවේ පළමු විධායක කමිටුව සමන්විත විය යුත්තේ ය.

විධායක කමිටුවේ සාමාජිකයකු සඳහා නුසුදුසුකම්.

**6**. යම් පුද්ගලයකු මතු දැක්වෙන එක් වර්ගයකට හෝ අයත් වේ නම් ඔහු හෝ ඇය විධායක කමිටුවට තෝරා පත් කර නොගත යුත්තේ ය:–

(අ) සංස්ථාවේ සාමාජිකයකු නොවීම;

(ආ) බෞද්ධයකු නොවීම;

(ඇ) බංකොලොත් හෝ බුන්වත් පුද්ගලයකු බවට අධිකරණය මගින් ප්‍රකාශ කරන ලද පුද්ගලයකු වීම;

(ඈ) සිහිවිකල තැනැත්තකු වීම;

(ඉ) දුරාචාරාත්මක වැරැද්දක් කළ බවට නිසි අධිකරණයකින් තීන්දු කරන ලද තැනැත්තකු වීම.

සංස්ථාවේ රීති.

7. (1) තත් කාර්යය සඳහා කැඳවනු ලැබූ සංස්ථාවේ මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු පිරිසකගේ අනුමැතියෙන් මතු දැක්වෙන කාර්යයන් සඳහා මේ පනතේ හෝ වෙනත් ලිඛිත නීතියක විධිවිධානයන්ට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:–

(අ) සංස්ථාවට සාමාජිකයන් බඳවා ගැනීම, ඉවත්වීම සහ නෙරපීම;

(ආ) විධායක කමිටුවේ සාමාජිකයන් දැරිය යුතු නිලයන් සහ නිලධාරීන් තෝරා පත් කර ගැනීම;

(ඇ) සංස්ථාවේ විධායක කමිටුවේ සහ අනෙකුත් විවිධ නිලධාරීන්, නියෝජිතයන් සහ සේවකයන්ගේ කාර්යයන් සහ යුතුකම්;

(ඈ) රැස්වීම්වල කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) එකී රීති (1) වන උපවගන්තියේ රීති සාදන ආකාරයෙන්ම ඒවාට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැක්කේ ය.

(3) සංස්ථාවේ සියළුම සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තේ ය.

මධ්‍යස්ථානයට ලැබිය යුතු සහ ගෙවිය යුතු ණය.

8. මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ දී මධ්‍යස්ථානයේ සියළුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවිය යුතු අතර එදිනට මධ්‍යස්ථානයට අයවිය යුතු සියළු ණය, ගෙවිය යුතු දායක මුදල් සහ සම්මාදම් මුදල් මෙම පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

9. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, තෑගි, තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, පරිත්‍යාග, දායක මුදල් හෝ ගාස්තු වශයෙන් සංස්ථාවට ලැබෙන සියලු මුදල් විධායක කමිටුව නිශ්චය කරනු ලබන එක් බැංකුවක හෝ බැංකු කිහිපයක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාව විසින් සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය, සංවර්ධනය සහ වැඩි දියුණු කිරීමේ කාර්ය සඳහා ක්ෂයවීමේ අරමුදලක් හෝ සංචිත හෝ ණය අරමුදලක් පිහිටුවනු ලැබිය හැකිය.

(3) සංස්ථාව ස්වකීය බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී දරන ලද සියලු වියදම් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

10. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් සංස්ථාවේ ආදායම සහ වියදම, වත්කම් සහ වගකීම් මෙන්ම සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මඟින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන සහ එකී ආයතනයේ සභාව විසින් ගණකාධිකාරීවරයකු ලෙස සේවයේ යෙදීමට නිකුත් කරන ලද සහතිකයක් සන්තකයේ ඇති තැනැත්තකු ; හෝ

(ii) එක් එක් නේවාසික කොටස්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මඟින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනක සාමාජිකයකු වන්නා වූ ද ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් සන්තකයේ දරන්නා වූ ද ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක්,

අදහස් වේ.

සංස්ථාව විසින් දේපළ දැරිය හැකි බව.

**11**. යම් මිළට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු බැහැර කිරීමකින් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව සතු වන චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට සහ දැරීමටත් සංස්ථාවේ රීතීන්ට යටත්ව එකී දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමටත් සංස්ථාවට හැකි වන්නේ ය. එමෙන් ම මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ දී මධ්‍යස්ථානය සතුව තිබූ සියලු දේපළ සංස්ථාවේ දේපළ වන්නේ ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**12**. සභාපතිවරයා සහ විධායක කමිටුවේ සාමාජිකයන් අතුරින් තවත් එක් අයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම ආකාරයක සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයට අත්සන් තැබිය යුතු අතර එම අත්සන් තැබීම යම් පුද්ගලයකු සාක්ෂිකරුවකු වශයෙන් අත්සන් තැබීමෙන් පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපල.

**13**. සංස්ථාව විසුරුවා හරිනු ලැබීමෙන් පසුව එහි සියලු ණය සහ බැරකම් ගෙවා බේරුම් කිරීමෙන් පසු කවර වූ හෝ දේපළක් ඉතිරි වේ නම් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර සංස්ථාවේ පරමාර්ථ වලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද යම් ආදායමක් හෝ දේපළක් තම සාමාජිකයන් අතර බෙදාදීම ස්වකීය රීති මඟින් තහනම් කරනු ලැබ ඇත්තා වූ ද වෙනත් ආයතනයකට හෝ ආයතතනවලට එම දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එකී ආයතනය හෝ ආයතන සංස්ථාව විසුරුවා හැරීමේදී හෝ ඊට පෙරාතුවම, සංස්ථාවේ සාමාජිකයන් විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් සුරැකීම.

**14**. ජනරජයේ හෝ රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මෙම පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් සිදු නොවිය යුත්තේ ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.